සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2019(II)**

| | | |
|---|---|---|
| **කාලය : පැය 03** | **ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) (14)** | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>…………………………… |

- ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

---

1. i. මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ආර්ථිකය මූර්ත වශයෙන් සංකෝචනයට ලක්වීම කෙරෙහි බලපාන ලද මූලික සාධක පැහැදිලි කරන්න. (ලකුණු 08)

   ii. සාර්ව ආර්ථික අස්ථායිතාව යන්නෙන් කුමක් අදහස් වන්නේ දැයි සාකච්ඡා කරමින් මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ අස්ථායිතාවට ලක්වූ සාර්ව ආර්ථික විචල්‍යයන් විස්තර කරන්න. (ලකුණු 12)

2. i. ආයෝජනයන් සඳහා වැදගත්වන ගෝලීය දර්ශකයන් දෙකක් (02) කෙටියෙන් සඳහන් කර එම ගෝලීය දර්ශකයන් අනුව, ශ්‍රී ලංකාවේ තත්ත්වය කෙබඳු දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 10)

   ii. ආයෝජන ආකර්ෂණය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ වැඩිදියුණු කළ යුතු යැයි හඳුනාගත් ප්‍රධාන ක්ෂේත්‍ර පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

3. i. විදේශ සේවා නියුක්තියේ ආර්ථික හා සමාජීය වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

   ii. ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තියන්ගේ ප්‍රේෂණ ඉහළ නංවා ගැනීමට ඇති බාධා මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

4. i. මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 10)

   ii. මෑත වර්ෂවල මහ බැංකුව ක්‍රියාවට නැංවූ මුදල් ප්‍රතිපත්ති මෙවලම් (Monitory Policy Instruments) සහ ඒවායේ වෙළඳපොල හා ආර්ථික බලපෑම් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

5. i. ආර්ථික හා සමාජීය යටිතල පහසුකම් යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කොට එහි වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

ii. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටකට ආර්ථික හා සමාජීය යටිතල පහසුකම් ප්‍රවර්ධනයේදී මුහුණදීමට සිදුවන ප්‍රධාන අභියෝග කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

6. i. කාබනික කෘෂිකර්මාන්තය (Organic Agriculture) ප්‍රවර්ධනය කිරීමෙහි ආර්ථික හා සමාජීය වැදගත්කම කෙටියෙන් විග්‍රහ කරන්න. (ලකුණු 10)

ii. කාබනික කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනයේදී ශ්‍රී ලංකාව මුහුණදෙන ප්‍රධාන අභියෝග විවරණය කරන්න. (ලකුණු 10)

7. i. රටක විදේශ වත්කම් සංචිතය යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කර විදේශීය වත්කම් සංචිත පහළ යාමකදී අපේක්ෂා කළ යුතු ආර්ථික හා සමාජ ප්‍රතිවිපාක විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

ii. මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ විදේශ වත්කම් සංචිත සීඝ්‍රයෙන් පහළ යාමට බලපාන ලද ප්‍රධාන සාධක මොනවාද? (ලකුණු 10)

************